ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
தேசிய அனர்த்த நிவாரண சேவைகள் நிலையம்
National Disaster Relief Services Centre
විද්‍යා මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
வித்யா மாவத்தை, கொழும்பு 07, இலங்கை
Vidya Mawatha, Colombo 07, Sri Lanka

දු.අ. /தொ.எ / T.N. 0112665258
ෆැක්ස් / பெக்ஸ் / Fax 0112665702
වි.තැ. / மி.அ.மு. / Email sahana.ndrsc@gmail.com


මගේ අංකය / எனது இல / My No. NDRSC/02/04/10

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2025.12. 14

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු,

<u>ආපදාවෙන් බලපෑමට ලක් වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන</u>

2025 නොවැම්බර් මස 21 වන දින සිට බලපෑ "දිට්වා සුළි කුණාටුව" හේතුවෙන් ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වය මත අංක 2464/30 දරණ හා 2025.11.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකාවේ මහජන හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත් කළ අතර 2025.11.28 දිනැති ආපදා සහන සේවා චක්‍රලේඛ 03/2025 මගින් 2025 නොවැම්බර් මස 21 වන දින සිට නැවත දැනුම්දෙන තෙක් සමස්ත ශ්‍රී ලංකාවම විස්තීර්ණ ආපදාවකට ලක් වූ බවට ප්‍රකාශයට පත් කරන ලදී.

02. ඒ අනුව, මෙම විස්තීර්ණ ආපදා තත්ත්වයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම, ජීවිත හානි වන්දි හා පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ පුද්ගලයන් වෙත වන්දි ලබාදීම, හානියට පත් නිවාස හා ව්‍යාපාර සඳහා වන්දි ලබාදීම, ආපදාවෙන් බලපෑමට ලක් වූ පාසල් සිසුන් වෙත දීමනා ලබාදීම, හානියට පත් නිවාස හා දේපළ, තනි, සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර සුදුසු පරිදි යථාවත් කර ගැනීම සඳහා දීමනා ලබාදීම හා තාවකාලිකව පදිංචි වන නිවාස වෙනුවෙන් මාසික කුලී දීමනා ලබාදීම හා ජීවනෝපාය අහිමි වූ පුද්ගලයන් සවිබල ගැන්වීම වෙනුවෙන් ආපදාවෙන් බලපෑමට ලක් වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන යන මැයෙන් 2025.12.05 වන දින නිකුත් කළ අයවැය චක්‍රලේඛ 08/2025 මගින් ලබා දී ඇති සහන පිළිබඳ වැඩිදුර උපදෙස් ලබා දීම සඳහා මෙම මාර්ගෝපදේශය නිකුත් කරනු ලැබේ. මෙම මාර්ගෝපදේශය සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ එකඟතාවය ලැබී ඇත.

<u>ආපදා සහන සැලසීම සඳහා සම්බන්ධ වන ආයතනවල කාර්යභාරය</u>

➢ මෙම චක්‍රලේඛය මගින් ආවරණය වන දීමනා හා සහන අනුව ආපදා සහන සේවා මාර්ගෝපදේශ 01/2025, 2.1 යටතේ ග්‍රාමීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුවෙහි නිලධාරීන්ට හා ප්‍රාදේශීය ලේකම් වෙත සහාය පිණිස පවතින සංයුතියට අමතරව පහත නිලධාරීන්ට ද වගකීම් පවරනු ලැබේ.

- පරිපාලන ග්‍රාම නිලධාරී
- සමාජ සේවා නිලධාරී
- ළමා රක්ෂණ නිලධාරී
- ළමා හිමිකම් නිලධාරී
- මුල් ළමාවිය සංවර්ධන නිලධාරී
- වනිතා සංවර්ධන නිලධාරී

- වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි
- කර්මාන්ත සංවර්ධන නිලධාරි
- කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි
- බෞද්ධ කටයුතු සමායෝජක
- ප්‍රජා සවිබල ගැන්වීමේ නිලධාරි
- සමෘද්ධි නිලධාරි
- නිවාස නිලධාරි
- අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන්

➢ ග්‍රාමීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුවෙහි පවතින කාර්යයන්ට අමතරව පහත කාර්යයන්ද ඇතුළත් කරනු ලැබේ.

- ආපදාවෙන් බලපෑමට ලක්වූ පාසල් සිසුන්ගේ නාම ලේඛණයක් පවත්වාගෙන යාම, දීමනා ගෙවීම හා නිසි පරිදි පාසල් සිසුන් සඳහා දීමනා ලැබුණු බවට තහවුරු කරගැනීම.
- හානියට පත් නිවාස පිළිබඳ ලේඛන පවත්වා ගැනීම හා නිවාස හානියට පත් පුද්ගලයින් වෙත නිවාස හානි වන්දි ගෙවීම.
- ආපදා හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ජනතාවගේ නාම ලේඛන නඩත්තු කිරීම, දීමනා ලබාදීම, අදාළ දීමනා නිසි පරිදි කලට වේලාවට ප්‍රතිලාභීන් වෙත ලැබුණු බවට තහවුරු කර ගැනීම හා දීමනාව ලබාදීමට අදාළව පැනනගින ගැටළු නිරවුල් කිරීමට කටයුතු කිරීම.
- ආපදා හේතුවෙන් පදිංචි නිවාසවලින් ඉවත් වීමට සිදු වූ ජනතාවගේ නාම ලේඛන නඩත්තු කිරීම, දීමනා ලබාදීම හා අදාළ දීමනා නිසිපරිදි කලට වේලාවට ප්‍රතිලාභීන් වෙත ලැබුණු බවට තහවුරු කරගැනීම.

➢ ප්‍රාදේශීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුවෙහි පවතින කාර්යයන්ට අමතරව පහත කාර්යයන්ද ඇතුළත් කරනු ලැබේ

- ආපදා හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ජනතාව වෙත දීමනා ලබාදීමට අදාළව පැනනගින ගැටළු නිරවුල් කිරීමට කටයුතු කිරීම.

➢ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුවෙහි පවතින කාර්යයන්ට අමතරව පහත කාර්යයන්ද ඇතුළත් කරනු ලැබේ.

- නිවාස යථාවත් කිරීම සඳහා ලබාදෙනු ලබන රුපියල් 25,000/-ක දීමනාව හා මුළුතැන්ගෙයි උපකරණ හා අත්‍යාවශ්‍ය ගෘහ උපකරණ මිලදී ගැනීමට ලබාදෙනු ලබන රුපියල් 50,000/-ක දීමනාව ලබාදීමේ දී ප්‍රතිලාභීන්

තෝරා ගැනීමේ දී පැන නගින ගැටළු පිළිබඳව අවශ්‍ය තීරණ ප්‍රාදේශීය අවශ්‍යතා ද සැළකිල්ලට ගෙන නිරවුල් කිරීම .

- ආපදා හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ජනතාව වෙත දීමනා ලබාදීමේදී මතුවන ගැටළු සහගත අවස්ථාවලදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව වෙත උපදෙස් ලබාදීම.

<u>ලබාදෙනු ලබන දීමනා හා සහන</u>

**01. හදිසි ආපදා තත්ත්වය පහව යාමත් සමඟ ආපදාවෙන් බලපෑමට ලක් වූ පවුල්වලට තම නිවස හෝ නව තාවකාලික නවාතැන නැවත පදිංචියට යෝග්‍ය පරිදි පිරිසිදු කර සුරක්ෂිතව පදිංචි වීම සඳහා පදිංචිව සිටි නිවසේ අයිතිය නොසලකා එක් නිවාස ඒකකයකට රුපියල් 25,000/- බැගින් දීමනාවක් ලබාදිය යුතුය.**

### 1.1 මෙම දීමනාව ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්

2025.11.21 වන දින සිට බලපෑ ආපදා තත්ත්වය මත කිසියම් හෝ ආපදාවක් හේතුවෙන්

- පූර්ණ හානියට පත් වූ නිවාස
- ගංවතුර, පිටාර ජලය, සුළි සුළං, නායයෑම්, කණ්ඩි කඩා වැටීම් හේතුවෙන් අර්ධ හානියට පත් වූ නිවාස
- නිවාස හානියක් සිදු නොවුණ ද ගංවතුර, සුළි සුළං, නායයෑම්, කණ්ඩි කඩා වැටීම් හේතුවෙන් අපිරිසිදු තත්ත්වයකට පත් වූ නිවාස

මෙම දීමනා ලැබීම සඳහා සුදුසුකම් ලබයි.

### 1.2 ඉඩමේ අයිතිය

- මෙම දීමනාව ගෙවීමේදී ඉඩමේ අයිතිය හා ආදායම් මට්ටම නොසලකා දීමනාව ලබාදිය යුතුය. ආපදාවලට ලක් වූ ස්ථිර පදිංචි නිවාස හිමියන්ට, වතු නිවාසවල පදිංචිකරුවන් , කුලී නිවාසවල පදිංචිකරුවන්, අනවසර නිවාසවල පදිංචිකරුවන්, රජයේ නිල නිවාසවල පදිංචිකරුවන් හා රජයේ ලියාපදිංචි ළමා නිවාස, වැඩිහිටි නිවාස හා ආබාධ සහිත තැනැත්තන්ගේ නේවාසික මධ්‍යස්ථානවලටද මෙම දීමනාව ලබාදිය යුතුය.

### 1.3 දීමනාව ලබාදීමේ පදනම

- 2025 නොවැම්බර් මස 21 වන දින සිට බලපෑ ආපදා තත්ත්වයෙන් බලපෑමට ලක්වූ තනි හෝ සංයුක්ත නිවාස වෙත පිරිසිදු කර ගැනීමේ කටයුතු සඳහා රුපියල් 25,000/- බැගින් මෙම දීමනාව හානි තක්සේරුවකින් තොරව ලබාදිය යුතුය.

- ඒ අනුව, එක් නිවාස ඒකකයක් තුළ පවුල් හෝ පුද්ගලයින් කිහිප දෙනෙක් පදිංචිව සිටින්නේ නම් නිවාස ඒකකයේ පදිංචි සියලු පවුල් හෝ පුද්ගලයින් අතර මෙම දීමනාව සම සේ බෙදී යා යුතුය.

- කුලී පදනමින් ලබා දී ඇති නිවසකට හිමි දීමනාව කුලී නිවැසියා වෙත පමණක් ලබාදිය යුතුය. පවුල් කිහිපයක් හෝ පුද්ගලයින් කිහිපදෙනෙක් කුලී නිවාසයක ජීවත් වන්නේ නම් එකී පවුල් හෝ පුද්ගලයන් අතර මෙම දීමනාව සමසේ බෙදී යා යුතුය.

- නිවස අයිතිකරුද කුලී නිවැසියන් හෝ පුද්ගලයින් ද සමඟ එකම නිවසක ජීවත් වන්නේ නම් මෙම දීමනාව ඔවුන් අතර ද සමසේ බෙදී යා යුතුය.

❖ මෙම දීමනාව 2025.11.21 වන දින සිට බලපෑ විස්තීර්ණ ආපදා තත්ත්වය හේතුවෙන් මෙම ආපදා අවස්ථාවට පමණක් බලපාන පරිදි ලබාදෙනු ලබන දීමනාවක් වන බැවින්, එම දීමනාව ආපදාවට පත් වූ සියලුම නිවාස ඒකක වෙත මුලු මුදල එකවර ගෙවා අවසන් කළ යුතුය. (මෙය අත්තිකාරමක් නොවේ)

**1.4 දීමනා ඉල්ලුම් කිරීම**

❖ ප්‍රතිලාභීන් විසින් දීමනා ඉල්ලුම් කරන ලද NDRSC 3.6 අයදුම්පත්‍ර (ඇමුණුම 01) අනුව සකස් කරගත් 3.2.1.(i) Division ආකෘතිය (ඇමුණුම 02) අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් ඉල්ලුම් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය දිස්ත්‍රික් ලේකම් විසින් 3.2.1. (i) District ආකෘතිය (ඇමුණුම 03) හා ප්‍රතිපාදන ඉල්ලීම් ලිපිය මගින් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය.

02. **ආපදාවෙන් බලපෑමට ලක් වූ නිවාසවල නැවත පදිංචියට අත්‍යාවශ්‍ය මුළුතැන්ගෙයි බඩු මුට්ටු, අත්‍යාවශ්‍ය ගෘහ උපකරණ ආදිය මිලට ගැනීම සඳහා නිවසේ අයිතිය නොසලකා එක් නිවාස ඒකකයකට රුපියල් 50,000/- බැගින් දීමනාවක් ලබාදිය යුතුය.**

**2.1 මෙම දීමනාව ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්**

2025.11.21 වන දින සිට බලපෑ ආපදා තත්ත්වය මත කිසියම් හෝ ආපදාවක් හේතුවෙන්

- ➢ පූර්ණ හානියට පත් වූ නිවාස
- ➢ ගංවතුර, පිටාර ජලය, සුළි සුළං, නායයෑම්, කණ්ඩි කඩා වැටීම් හේතුවෙන් අර්ධ හානියට පත් වූ නිවාස
- ➢ ගංවතුර, පිටාර ජලය, සුළි සුළං, නායයෑම් හා කණ්ඩි කඩාවැටීම් හේතුවෙන් මුළුතැන්ගෙයි උපකරණ හා අත්‍යවශ්‍ය ගෘහ භාණ්ඩ හානියට පත් වූ නිවාස

**2.2 ඉඩමේ අයිතිය**

❖ මෙම දීමනා ගෙවීමේදී ඉඩමේ අයිතිය හා ආදායම් මට්ටම නොසලකා දීමනාව ලබාදිය යුතුය. ආපදාවලට ලක් වූ ස්ථිර පදිංචි නිවාස හිමියන්ට, වතු නිවාසවල පදිංචිකරුවන් , කුලී නිවාසවල පදිංචිකරුවන්, අනවසර නිවාසවල පදිංචිකරුවන්, රජයේ නිල නිවාසවල පදිංචිකරුවන් හා රජයේ ලියාපදිංචි ළමා නිවාස, වැඩිහිටි නිවාස හා ආබාධ සහිත තැනැත්තන්ගේ නේවාසික මධ්‍යස්ථානවලටද මෙම දීමනා ලබාදිය යුතුය.

**2.3 දීමනා ලබාදීමේ පදනම**

2025 නොවැම්බර් මස 21 වන දින සිට බලපෑ ආපදා තත්ත්වයෙන් බලපෑමට ලක්වූ නිවාස ඒකකයෙහි මුළුතැන්ගෙයි උපකරණ හා අත්‍යාවශ්‍ය ගෘහ උපකරණ හානි වී ඇත්නම් එම භාණ්ඩ නැවත මිලදී ගැනීම සඳහා රුපියල් 50,000/- බැගින් හානිය තහවුරු කරගැනීමෙන් අනතුරුව ලබාදිය යුතුය.

- ඒ අනුව, එක් නිවාස ඒකකයක් තුළ පවුල් හෝ පුද්ගලයින් කිහිප දෙනෙක් පදිංචිව සිටින්නේ නම් නිවාස ඒකකයේ පදිංචි සියලු පවුල් හෝ පුද්ගලයින් අතර මෙම දීමනාව සම සේ බෙදී යා යුතුය.

- කුලී පදනමින් ලබා දී ඇති නිවසකට හිමි දීමනාව කුලී නිවැසියා වෙත පමණක් ලබාදිය යුතුය. පවුල් කිහිපයක් හෝ පුද්ගලයින් කිහිපදෙනෙක් කුලී නිවාසයක ජීවත් වන්නේ නම් එකී පවුල් හෝ පුද්ගලයන් අතර මෙම දීමනාව සමසේ බෙදී යා යුතුය.

- නිවස අයිතිකරුද කුලී නිවැසියන් හෝ පුද්ගලයින් ද සමඟ එකම නිවසක ජීවත් වන්නේ නම් මෙම දීමනාව ඔවුන් අතර ද සමසේ බෙදී යා යුතුය.

**2.4 දීමනා ඉල්ලුම් කිරීම**

❖ ප්‍රතිලාභීන් විසින් දීමනා ඉල්ලුම් කරන ලද NDRSC 3.7 අයදුම්පත්‍ර (ඇමුණුම 04) අනුව සකස් කරගත් 3.2.1.(ii) Division ආකෘතිය (ඇමුණුම 05) අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් ඉල්ලුම් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය දිස්ත්‍රික් ලේකම් විසින් 3.2.1. (ii) District ආකෘතිය (ඇමුණුම 06) හා ප්‍රතිපාදන ඉල්ලීම් ලිපිය මගින් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය.

❖ මෙම රුපියල් 25,000/- හා රුපියල් 50,000/- දීමනා ලබාදීමේ දී ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී පැන නගින ගැටළු පිළිබඳව අවශ්‍ය තීරණ ප්‍රාදේශීය අවශ්‍යතා ද සැළකිල්ලට ගෙන දිස්ත්‍රික් ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව මගින් නිරවුල් කරගත යුතුවේ. එම තීරණ අවසන් තීරණ ලෙස සැලකේ.

❖ නිවාස යථාවත් කිරීම සඳහා ලබාදෙනු ලබන රුපියල් 25,000/-ක දීමනාව හා මුළුතැන්ගෙයි උපකරණ හා අත්‍යාවශ්‍ය ගෘහ උපකරණ මිලදී ගැනීමට ලබාදෙනු ලබන රුපියල් 50,000/-ක දීමනාව ලබාදීමට අදාළ ප්‍රතිලාභී නාමලේඛන ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත යොමු කළ යුතුය.

**03. නායයෑම් හා ගංවතුර හේතුවෙන් තම පදිංචි නිවස අහිමි වූ හෝ නිවස පූර්ණ ලෙස හානිවීම හේතුවෙන් ජීවනෝපාය කටයුතුවල අඛණ්ඩව නිරත වීමට නොහැකි පවුල් වෙත ගෙවනු ලබන දීමනාව**

- ආපදාවෙන් බලපෑමට ලක්වීම හේතුවෙන් තම පදිංචි නිවස අහිමි වූ හෝ නිවස පූර්ණ ලෙස හානිවීම හේතුවෙන් සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් අවදානම් ලෙස හඳුනාගත් පදිංචියට නුසුදුසු ලෙස නිර්දේශ කිරීම හේතුවෙන් ජීවනෝපාය කටයුතුවල අඛණ්ඩව නිරතවිය නොහැකි පවුල් සඳහා පමණක් මෙම දීමනාව හිමි වේ.
- කුලී නිවසක පදිංචිව සිට ආපදාවෙන් බලපෑමට ලක්වීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූවන් ද මේ සඳහා හිමිකම් ලබයි.

**3.1** මෙම දීමනාව පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව පහත පරිදි මාස 03ක කාලයක් සඳහා ලබාදිය යුතුය.

- සාමාජිකයින් සංඛ්‍යාව 02 හෝ ඊට අඩු පවුල් සඳහා මසකට රුපියල් 25,000/-
- සාමාජිකයින් සංඛ්‍යාව 02ට වැඩි පවුල් සඳහා මසකට රුපියල් 50,000/-

- මෙම දීමනාව 2025 දෙසැම්බර් හා 2026 ජනවාරි හා පෙබරවාරි මාස සඳහා තනි හෝ සංයුක්ත නිවාසවල ජීවත් වූ පවුල් වෙත වෙන් වෙන්ව රුපියල් 25,000/- බැගින් මාස 03ක් සඳහා ගෙවනු ලබන මාසික දීමනාවකි.

- දීමනාව ලබාදීමට අදාළව පැනනගින ගැටළු ප්‍රාදේශීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව මගින් නිරවුල් කරගත යුතුය.

- එසේ නිරවුල් කරගත නොහැකි අවස්ථාවලදී දිස්ත්‍රික් ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව වෙත යොමු කර උපදෙස් ලබාගැනීම සුදුසු වේ.

3.2 මෙම දීමනාව පවුලේ ගෘහ මූලිකයා වෙත නිදහස් කළ යුතුය.

- ප්‍රතිලාභීන් විසින් සම්පූර්ණ කරන ලද 2.6 අයදුම්පත්‍ර (ඇමුණුම 07) අනුව සකස් කරගත් 2.6.1 Division ආකෘතිය (ඇමුණුම 08) අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් ඉල්ලුම් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය දිස්ත්‍රික් ලේකම් විසින් 2.6.1 District ආකෘතිය (ඇමුණුම 09) හා ප්‍රතිපාදන ඉල්ලීම් ලිපිය මගින් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය.

**04. ආපදාවෙන් බලපෑමට ලක්වූ පාසල් සිසුන්ට පොත්පත් සහ ඇඳුම් පැළඳුම් මිලදී ගැනීම සඳහා එක්වරක් පමණක් ලබාදෙන දීමනාවක් ලෙස එක් පාසල් දරුවෙකුට රුපියල් 15,000/- බැගින් දීමනාවක් ලබාදිය යුතුය.**

4.1 විදුහල්පති විසින් සහතික කරන ලද හා ග්‍රාම නිලධාරි විසින් නිර්දේශ කරන ලද ආකෘතිය 2.7 අයදුම්පත්‍ර (ඇමුණුම 10) අනුව සකස් කරගත් 2.7.1 (Division) ආකෘතිය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් ඉල්ලුම් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය 2.7.1 (District) ආකෘතිය හා ප්‍රතිපාදන ඉල්ලීම් ලිපිය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙතින් ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය.

4.2 දීමනා මුදල් ලබාදෙන ලද ප්‍රතිලාභී නාමලේඛන ජාතික ආපදා සේවා මධ්‍යස්ථානය වෙත යොමු කළ යුතුය.

**05. නායයෑම් හා ගංවතුර ආපදා තත්ත්වය හේතුවෙන් තම නිවස අහිමි වී පදිංචි වීමට නිවසක් නොමැති නිවාස හිමියන් සඳහා නව නිවසක් ඉදිකර ගන්නා තෙක් වෙනත් ස්ථානයක තාවකාලිකව පදිංචි වීම සඳහා මසකට රුපියල් 25,000/- බැගින් උපරිමය මාස 06ක් දක්වා මාසික කුලී දීමනාවක් ලබාදිය යුතුය.**

- ආපදාවට ලක්වීම තත්ත්වය හේතුවෙන් නිවස පූර්ණ හානියට පත් වීමෙන් තම පදිංචි නිවස අහිමි වී පදිංචි වීමට නිවසක් නොමැති නිවාස හිමියන් සඳහා නව නිවසක් ඉදිකර ගන්නා තෙක් වෙනත් ස්ථානයක තාවකාලිකව පදිංචි වීමට මෙම කුලී නිවාස දීමනාව හිමි වේ.
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් අවදානම් ලෙස හඳුනාගත් පදිංචියට නුසුදුසු ලෙස නිර්දේශ කර ඇති නිවාස හිමියන් සඳහාද මෙම දීමනාව හිමි වේ.

- මෙය කුලී නිවැසියන් සඳහා ගෙවනු නොලැබේ.

- ස්ථිර පදිංචිව සිටි නිවස සඳහා පමණක් නිවාස හිමිකරුට පමණක් හිමිවන මෙම දීමනාව එක් පුද්ගලයෙකු සඳහා එක් නිවසකට පමණක් ගෙවනු ලබන දීමනාවකි. ස්ථිර පදිංචි නිවසට අමතරව එම පුද්ගලයා සතු හානියට පත් වූ අනෙකුත් නිවාස සඳහා මෙම දීමනාව ගෙවනු නොලැබේ.

- නිවාස කුලී දීමනාව ඉල්ලුම් කර ප්‍රතිලාභීන් විසින් සම්පූර්ණ කරන ලද ආකෘතිය 2.8 අයදුම්පත්‍ර (ඇමුණුම 11) අනුව සකස් කරගත් 2.8.1 (Division) ආකෘතිය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් ඉල්ලුම් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය 2.8.1 (District) ආකෘතිය හා ප්‍රතිපාදන ඉල්ලීම් ලිපිය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙතින් ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය.

- නිවාස කුලී දීමනා මුදල් ලබාදෙන ලද ප්‍රතිලාභී නාමලේඛන ජාතික ආපදා සේවා මධ්‍යස්ථානය වෙත යොමු කළ යුතුය.

**එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික)**
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී,
එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයන-චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන), එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

<u>පිටපත්:</u>

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. ලේකම්, මුදල් , ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශය
6. ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
7. විගණකාධිපති

(5–7) අදාළ වන පරිදි නිලධාරීන් වෙත උපදෙස් නිකුත් කිරීම සඳහා